1. නිපුණතාවය 01 - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ මූලික සංකල්ප
   නිපුණතා මට්ටම 1.1 - දත්තවල සහ තොරතුරුවල මූලික තැනුම් ඒකක හා ඒවායේ ගතිලක්ෂණ විමර්ශනය

දත්ත ජීවන චක්‍රය (Life Cycle of Data)

දත්ත තොරතුරු බවට පත්කරලීමේ ක්‍රියාවලිය අංශ කිහිපයකට බෙදා හඳුනා ගත හැක.

1. **දත්ත ඒකරාශී කිරීම -** *<u>සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, නිරීක්ෂණය, ප්‍රශ්නාවලි භාවිතය, සමීක්ෂණය</u>* යන ක්‍රම ඔස්සේ දත්ත රැස්කිරීම සිදු කරනු ලැබේ.
2. **පිළියෙල කිරීම -** ඇතම් දත්ත ලබාගත් ආකාරයෙන්ම සැකසීමේ ක්‍රියාවලියට භාජනය කල නොහැක. එබැවින් දත්ත ඒකාබද්ධ කිරීම, අවශ්‍ය නැති දත්ත ඉවත් කිරීම හා සුදුසු ආකාරයට දත්ත පිළියෙල මෙම පියවරේදී සිදු කරනු ලැබේ.
3. **දත්ත ආදානය -** පිළියෙල කරගත් දත්ත පරිගණකයට ඇතුළත් කිරීම මෙම පියවරේ දී සිදුකරනු ලැබේ. පරිගණකයට දත්ත ඇතුලත් කිරීමට විවිධ උපාංග නිපදවා ඇත.
4. **දත්ත සැකසීම -** ආදානය කල දත්ත පරිගණක මෘදුකාංගයක් උපයෝගී කරගෙන සැකසීම මෙහිදී සිදුවන අතර මෘදුකාංගයේ ඇති උපදෙස් අනුව ප්‍රතිදාන බිහිවීම සිදු වේ.
5. **ප්‍රතිදානය -** දත්ත සැකසීමෙන් බිහි කරගන්නා ලද තොරතුරු පරිශීලකයාට යොමු කිරීම ප්‍රතිදානය ලෙස හැඳින්වේ. පරිගණක තිරය හෝ මුද්‍රණ යන්ත්‍ර බහුලව මේ සඳහා යොදා ගැනේ.
6. **ගබඩා කිරීම -** සකසා ගන්නා ලද තොරතුරු මෙන්ම ඒ සඳහා භාවිතා කරන ලද දත්ත අනාගත භාවිතය සඳහා තැන්පත් කර ගැනීම මෙම පියවරේදී සිදුකරනු ලැබේ.

වටිනා තොරතුරුවල ගතිලක්ෂණ (Characteristics of Information)

- තොරතුරු අර්ථවත් විය යුතුය.
- තොරතුරු විශ්මය දනවන සුළු විය යුතුය.
- තොරතුරු මගින් පෙර දැනුම ස්ථාවර කරයි.
- තොරතුරු කාලීන විය යුතුය.
- තොරතුරු යනු අන්තර් සන්නිවේදන මාධ්‍යයකි.

ඉහත ගතිලක්ෂණ වලින් යුත් තොරතුරක වටිනාකම හා ගුණාත්මක බව සඳහා පහත සාධක බලපායි.

1.අදාළත්වය	2.සම්පූර්ණත්වය
3.නිවැරදිතාවය	4.කාලානුරූපී වීම
5.විශ්වාසනීයත්වය	6.තේරුම්ගත හැකිවීම.
7.පිරිවැයට වටිනාකමක් තිබීම.	8.පරිශීලකයාගේ අවශ්‍යතා සපුරාලීම.

1. දත්ත තොරතුරු බවට පත්කිරීමේ ක්‍රියාවලිය විස්තර කරන්න.
2. ගුණාත්මක තොරතුරක පවතින ගතිලක්ෂණ පහදා එවැනි ගුණත්මක තොරතුරක් බිහිවීමට බලපාන සාධක නම් කරන්න.